# මහාගෝපාලක සූත්‍රයෙන් හෙළිවන භික්ෂුවගේ කාර්යභාරය

*- වරදිවෙල විජයසුමන හිමි -*

**පිවිසීම** - බුදුසමය ප්‍රකට කරන පරමාදර්ශී සමාජය භික්ෂූන්ගෙන් සමන්විත සංඝ සමාජයයි. භික්ෂුව පරමාදර්ශී සමාජය නියෝජනය කරන්නෙකු වන හෙයින් භික්ෂු ජීවිතය උදාර ගුණ ධර්මයන්හි ප්‍රතිමූර්තියක් විය යුතුය. සමස්ත සමාජය වෙත සපයන ආදර්ශය, ශික්ෂා සංවරය, ඉන්ද්‍රිය දමනය, ආජීව පාරිශුද්ධිය, අල්පේච්ඡතාව, සන්තුෂ්ටිතාව වැනි ගුණධර්මයන්ගෙන් පෝෂිත වූවක් විය යුතුවේ. මෙම ගුණධර්ම වර්ධනය කරගැනීම සඳහා භික්ෂු සමාජයට මාර්ගෝපදේශකත්වය සපයන සූත්‍ර දේශනා අතර මජ්ඣිම නිකායේ මූල පණ්ණාසකයේ මහාගෝපාලක සූත්‍රය වැදගත් ස්ථානයක් හිමි කරගනී.[1]

## සූත්‍රයෙහි සාරාංශය

මහාගෝපාලක සූත්‍රය ආරම්භ වන්නේ ගොපල්ලෙකුගේ චර්යා රටාව උදාහරණ ලෙස දැක්වීමෙනි. ගවරැළක් පාලනයෙහි නියුතු ගොපල්ලෙකු සතුව පවතින අයහපත් චර්යා රටාව නිසා ඔහු ඒ සඳහා

1 ම.නි. I, මහාගෝපාලක සූත්‍රය, පිටු 526-534

0 2 MAY 2012

නුසුදුසු අයකු බවට පත්වන ආකාරය පළමුව විස්තර කෙරේ දෙවනුව විස්තර කෙරෙනුයේ ගවරැළ පාලනයට නුසුදුසු ගොපල්ලා මෙන්ම ශාසනික චර්යාවෙහි නියැලෙන භික්ෂුව ඒ සඳහා අයෝග්‍ය භාවයට පත්වන ආකාරයයි. ශාසනික චර්යාවෙහි යහපත් ලෙස නිරතවෙමින් ඒ සඳහා සුදුස්සෙකු වන භික්ෂුව පිළිබඳව කරුණු දැක්වීම මෙම සූත්‍ර දේශනාවෙහි ප්‍රස්තුතය වේ.

**අයහපත් ගොපල්ලාගේ ස්වභාවය.**

ගොපල්ලාගේ වගකීම වන්නේ තමන් විසින් පාලනය කරන ගවරැළ හා අදාළ කාර්යයන්හි උචිත පරිදි නිරත වෙමින්, ගවරැළෙහි ආරක්ෂාව හා දියුණුව උදෙසා කටයුතු කිරීමයි. ඒ සඳහා ගවපාලනය පිළිබඳව සියලු කාර්යයන්හි ඔහු දක්ෂයකු විය යුතුය. එසේ නොවන්නේ නම් ඔහු එම කාර්යයෙහි නිරතවීමට සුදුස්සෙකු නොවන්නේය. ගෙපල්ලා සිය කාර්යයෙහි අසමර්ථතා ප්‍රකට කරන ලක්ෂණ එකොළොසකි. එම ලක්ෂණ මෙසේ විස්තර කළ හැකිය.[2]

ගොපල්ලා තම ගවරැළෙහි සිටින ගවයන් සංඛ්‍යාත්මකව කෙතෙක්දැයි දැන සිටිය යුතුය. ඒ ඒ වර්ණ සහිත ගවයන් සංඛ්‍යාව ද දත යුතුය. ඒ අනුව සංඛ්‍යාත්මකව හෝ වර්ණ වශයෙන් හෝ සිය ගවරැළ පිළිබඳව දැනුම ගොපල්ලා සතුවීම අනිවාර්ය වේ. එවැනි දැනුමක් නොමැති ගොපල්ලා සිය කාර්යයෙහි දක්ෂයෙකු බවට පත් නොවේ. මෙම ගොපල්ලා සිය ගවරැළෙන් ගවයන් පැහැර ගත් බව මෙන්ම, වෙනත් ගවරැළකින් තම රැළට එක්වූ ගවයන් ගැන ද නොදනී.

[2] ඉධ භික්ඛවෙ ගොපාලකො න රූපඤ්ඤූ හොති, න ලක්ඛණ කුසලො හොති, න ආසාටිකං සාටෙතා හොති, න වණං පටිච්ඡාදෙතා හොති, න ධූමං කත්තා හොති, න තිත්ථං ජානාති, න වීථිං ජානාති, න ගොචර කුසලො හොති, අනවසෙස දොහී ච හොති, යෙ තෙ උසභා ගොපිතරො ගො පරිණායකො තෙන අතිරෙක පූජාය පූජෙතා හොති - එම-



ඔහුගේ නැති වූ ගවයන් නැතිවූවන්ම වන අතර, වෙනත් රංචුවලට අයත් ගවයින් ගෙන ඔහු හැසිරේ. පසුව පැමිණෙන අන් ගව හිමියන් ඔවුන් රැගෙන යන අතර ඔහුගේ ගව පට්ටිය පිරිහේ. ඔහු ගව පට්ටියෙන් ලබන ලාභය ද පිරිහේ.[3]

ගොපල්ලා තමාගේ ගව රංචුවේ සිටින ගවයන්ගේ සිරුරෙහි හංවඩු ගැසූ ලකුණු දත යුතුය. (ලක්ඛණ කුසලො) දුනු, ත්‍රිශූල ආදී වශයෙන් හංවඩු ගසා ඇති ලකුණු නොදැනීම පිහිරීමට හේතුවකි.[4] තම ගව රංචුවේ සිටින ගවයන් පැහැරගත් විට හෝ පලාගිය විට අසවල් ලකුණු ඇති ගවයන් නැතැයි දැන ගැනීමට මෙම ලකුණු උපකාරී වේ. ගව රැළෙහි දක්ෂ අදක්ෂ ගවයන් හඳුනාගැනීමට ද මෙම ලකුණු උපකාරී වේ.

ගවයන් වනයෙහි හැසිරෙන විට නොයෙක් ආකාරයේ තුවාල ආදිය ඇතිවේ. කුර දණිස් ආදිය වණ වේ. එහි නිල මැස්සෝ ඉඟද තබති. එකී නිලමැස්සන් ඉවත් කොට එම තුවාල සුවවීම සඳහා ඉඟද ඉවත් කළ යුතුය. ඇතැම් ගොපල්ලෝ එසේ නොකරති. (න අසාටිකං සාටෙන්ති) එසේ පිළියම් නොයෙදීම නිසා ගවයන් මරණයට පවා පත්විය හැකිය. එම ස්වභාවය ගවරංචුවේ පිරිහීමකි. එසේම ගොපල්ලාගේ ද පිරිහීමකි.[5]

[3] න රූපඤ්ඤූ හොතීති, ගණනතො වා වණ්ණතො වා රූපං න ජානාති, ගණනතො න ජානාති නාම අත්තනො ගුන්නං සතං වා සහස්සංවාති සංඛං න ජානාති, සො ගාවිසු හටා වා ඵලාතාසු වා ගො ගණං ගහෙත්වා අජ්ජ එත්තිකා න දිස්සන්තිති..........
ම.නි. අට්ඨකථා, II හේ.මු. 1943 පිටුව 215

[4] න ලක්ඛණ කුසලො ති ගාවීනං සරීරෙ කතං ධනුසත්ති තිසුලාදි භෙද ලක්ඛණං න ජානාති, සො ගාවීසු හටාසු වා ඵලාසු වා අජ්ජ අසුක ලක්ඛණංච අසුක ලක්ඛණංච න දිස්සන්තීති. -එම-

[5] න අසාටිකං සාටෙතාති ගුන්නං ඛාණු කණ්ණකාදීහි පහට්ඨානෙසු වණෙ හොති. තත්ථ නීල මක්ඛිකා අණ්ඩකානි ඨපෙන්ති. තෙසං ආසාටිකාති නාම, තානි දණ්ඩකෙන අපනාමෙත්වා භෙසජ්ජං දාතබ්බං හොති. -එම-

02 MAY 2012

අදක්ෂ ගොපල්ලා සිය ගවරැළෙහි ගවයන්ගේ වණ ආදිය සඳහා බෙහෙත් යොදා පිළියම් නොකරයි. තුවාල සඳහා බෙහෙත් යොදා යමකින් එය වසා තැබිය යුතුය. එසේ නොකරන කල්හි ගවයන්ගේ වණ වලින් ඕජාව වැගිරේ. ඔවුනොවුන් එකට ගැටීමෙන් අනෙක් ගවයන්ගේ සිරුරුවල ද තුවාල හට ගන්නා අතර, ගවයෝ රෝගී වෙති. මේ හේතුවෙන් ගව රැළ පිරිහේ. පස්ගෝරසාදිය නොලැබීම නිසා ගොපල්ලා ද පිරිහේ.[6]

ගවගාල්වල මැසි මදුරුවන් බෝ වන විට එම උවදුරු වලකනු පිණිස දුම් ඇල්ලිය යුතුය. එහෙත් අනුවණ ගොපල්ලා එසේ නොකරයි. එසේ නොකරන විට ගවයෝ රෑ කළ නිදි වරති. පසුදින තැන් තැන්වල වැටී නිදන අතර ආහාර සොයා නොයති. ඔවුන්ගේ ශරීර දුර්වල වේ. ගවරැළ පිරිහීමට පත්වේ.[7]

ඇළ දොළ ගංගාදියෙන් ගවයන් එතෙර කරන විට එම තොටුපලෙහි සම විසම තැන් මෙන්ම ගැඹුරු නොගැඹුරු තැන් ද නොදන්නා ගොපල්ලා (තිත්ථං න ජානාති) අයහපත් වූවෙකි. එසේ නොදන්නා තොටුපලවලින් ගවයන් එතෙර කිරීමේදී ගවයෝ විවිධ පීඩාවන්ට ලක්වෙති. කිඹුලන්ගේ ග්‍රහණයට ලක්වෙති. එවිට ද ගව රැළ පිරිහේ.[8]

6 න වණං පටිච්ඡාදෙතා හොතීති ගුන්නං වුත්තනයෙනෙව සඤ්ජාතො වණො හෙසජ්ජං දත්වා වාතෙන වා චීරකෙන වා බන්ධිත්වා පටිච්ඡාදෙතබ්බො හොති, බාලො ගොපාලකො තත්ථෙව න කරොති. අවස්සං ගුන්නං වණෙහි යූසා පග්ඝරන්ති. -එම-

7 න ධූමං කත්තා හොතීති අන්තො වස්සේ ඩංස මකසාදීනං උප්පන්න කාලෙ ගොගණෙ වජං පවිවෙධ තත්ථ තත්ථ ධූමො කාතබ්බො හොති. අපණ්ඩිතො ගොපාලකො තං න කරොති, ගොගණො සබ්බ රත්තිං ඩංසාදීනි උපද්දාතො නිද්දං අලභිත්වා පුන දිවසෙ අරඤ්ඤෙ තත්ථ තත්ථ මූලාදීසු නිපජ්ජිත්වා නිද්දායති...... එම ...... පිටුව 216

8 න තිත්ථං ජානාතීති තිත්ථං සමන්ති වා විසමංතිවා සගාහන්ති වා නිග්ගාහන්ති වා න ජානාති, සො අතිත්ථෙන ගාවියො ඔතාරෙති, තාසං විසම තිත්ථෙ පාසාණා දීනි පාදා හිජ්ජන්ති. - එම -.



අයහපත් ගොපල්ලා ගවයන් ජලය පානය සඳහා යොමුකළ විට ඒ පිළිබඳව අවධානයෙන් පසු නොවේ . ජලය පානය කළ හා නොකළ ගවයන් පිළිබඳව ඔහු නොදන්නේය. (න පීතං ජානාති) ජලය පානය සඳහා අවසර නොලද ගවයන්ට ඉඩ ලබාදිය යුතුය. එසේ නොවුනු විට ගවයෝ ක්ලාන්ත වෙති. තණ ආදිය කෑමට අවස්ථා නොලබන එම දෙනුන්ගේ කිරි සිඳීයයි. ගවයන්ගේ ශරීර ශක්තිය පිරිහීයයි. එම තත්වය ගව රැළේ ද පිරිහීමට හේතුවකි.[9]

සිය ගව රැළෙහි ගවයන් තණ පිණිස ගෙන යන මාර්ගයෙහි ස්වභාවය පිළිබඳව අයහපත් ගොපල්ලා නොදනී. (න වීථිං ජානාති) එම මගෙහි සිටින සිංහාදී නපුරු සතුන්ගේ ග්‍රහණයට ලක්වන ගවයෝ විනාශ වෙති. සොරුන්ගේ ග්‍රහණයට ලක් විය හැකිය. එය ද ගව රැළෙහි පිරිහීමකි.[10]

අයහපත් ගොපල්ලා සිය ගව රැළ ආහාර පිණිස ගෙන යායුතු ස්ථානය නොදනී. (න ගොචර කුසලො හොති) පෙර දින ගවරැළ තණ පිණිස හැසිරවූ ප්‍රදේශයේ පසුදින ද හැසිරවීම අදක්ෂ ගොපල්ලාගේ ලක්ෂණයකි. මහත් ගව සමූහයක් පෙර දින හැසුරුණ ප්‍රදේශයේ තණ ඉතිරි නොවේ. මෙම ස්වභාවය වටහා නොගන්නා අදක්ෂ ගොපල්ලා සිය ගව රැළ පරිහානියට පත් කරවයි.[11]

9 න පීතං ජානාතීති ගොපාලකෙනහි ඉමං ගාවියා පීතං, ඉමාය න පීතං, ඉමාය පානීය තිත්ථෙ ඔකාසො ලද්ධො, ඉමාය න ලද්ධොති එවං පීතං ජානිතබ්බං හොති, අයං පන දිවසභාගං අරඤ්ඤෙ ගොගණං රක්ඛිත්වා..... තත්ථ අපීත ගාවියො පිපාසය සුක්ඛමානා යාව දත්තං තිණාහි බාදිතුං න සක්කොන්ති. - එම-

10 න වීථිං ජානාති යං මග්ගො සමො, ඛෙමො, අයං විසමො සාසංකො සප්පටිභයොති න ජානාති. සො සමං ඛෙමං මග්ගං වජ්ජේත්වා ගොගණං ඉතරං මග්ගං පටිපාදෙති. තත්ථ ගාවො සීහ ව්‍යග්ඝාදීනං ගන්ධෙන චොර පරිසසයෙන වා -එම-

11 න ගොචර කුසලො හොතී'ති, ගොපාලකෙනහි ගොචර කුසලෙන භවිතබ්බං, පඤ්චාහිකවාරො වා සත්තාහිකවාරො වා ජානිතබ්බො එකදිසාය ගො ගණා වාරෙත්වා -එම-

ගව රැළෙහි පැවැත්ම හා වර්ධනය උදෙසා අලුතින් ගවයින් එකතු විය යුතුය. ගව පැටවුන්ගේ වර්ධනය සඳහා ඉතිරි කොට මවු දෙනුන්ගෙන් කිරි දොවා ගැනීම කළ යුතුය. අයහපත් ගොපල්ලා එසේ නොකරයි. (අනවසෙසදොහී ච හොති) කිරිබොන වියෙහි පසුවන පැටව් කිරි නොලබා මියයති. මව් දෙන්හු ද සිය පැටවුන් මළ ශෝකයෙන් කම්පාවට පත්වෙති. තණ නොකති. ඔවුන්ගේ තනවල කිරිසිඳී යයි. ගව සමූහය පිරිහේ. ගොපල්ලා ද පස්ගෝරසයෙන් පිරිහේ.[12]

ගව රැළෙහි නායකත්වය දරනුයේ නායක ගවයන් විසිනි. නුවණැති ගොපල්ලා නායක ගොනුන්ට අතිරේක සැලකිලි දක්වයි. ශරීරය සැරසිලිවලින් අලංකාර කරයි. එහෙත් අනුවණ ගොපල්ලා මේ කිසිවක් නොකරයි. සත්කාර නොලබන ගව නායකයෝ ගවයන් රැකීමෙහි උත්සාහවත් නොවෙති. උවදුරුවලින් බේරා නොගනිති. මේ හේතුවෙන් ගව සමූහය පිරිහීමට පත්වේ.[13]

## අයහපත් භික්ෂුවගේ ලක්ෂණ

තම ගව රැළ පාලනයෙහි අදක්ෂ වූ ගොපල්ලා මෙන්ම අයහපත් ලක්‍ෂණ එකොළොසකින් යුතු භික්ෂුව ද ශාසනික චර්යාවෙහි හැසිරීමෙන් ලද යුතු ඵලය නොලබයි. ගොපල්ලා පස්ගෝ රසයට හිමිකම් නොලබන්නාක් මෙනි. එවැනි භික්ෂුව නිර්වාණගාමී ප්‍රතිපදාවෙහි අසමත් වූයේ වේ. එවැනි භික්ෂුවක සතු වන අයහපත් ලක්ෂණ මෙසේ ලැයිස්තු ගත කළ හැකිය.[14]

1. රූපයෙහි යථා ස්වභාවය නොදැනීම.
   (න රූපඤ්ඤූ හොති)
2. පුද්ගල චරිත ස්වභාවය හඳුනාගත නොහැකිවීම
   (න ලක්ඛණ කුසලො හොති)
3. අයහපත් සිතුවිලි ආශ්‍රිත චර්යා ඉවත් නොකිරීම
   (න ආසාටිකං සාටෙතා හොති)
4. ඉන්ද්‍රිය සංවරයෙන් තොරවීම
   (න වණං පටිච්ඡාදෙතා හොති)
5. දහම් නොදැනීම
   (න ධූමංකත්තා හොති)
6. නොදත් දේ අසා දැන නොගැනීම
   (න තිත්ථං ජානාති)
7. ධර්ම ප්‍රීතිය නොලැබීම
   (න වීථිං ජානාති)
8. නිර්වාණ මාර්ගය නොදැනීම
   (න වීථිං ජානාති)
9. භාවනා මාර්ගය නොදැනීම
   (න ගොචර කුසලො හොති)
10. සිවුපසෙහි පමණ නොදැනීම
    (අනවසෙසදොහි හොති)
11. වැඩිහිටි සංඝයාට ගරු නොකිරීම
    (සංඝ පිතරො සංඝ පරිණායකා න අතිරෙක පූජාය පූජිතා හොති

[12] අයං වච්ඡකස්ස කිංචි අසේසෙත්වා දුහති. ඛීරපකො වච්ඡො ඛීර පිපාසය සුක්ඛති. සන්ධාතුං අසක්කොන්තො කම්පමානො මාතු පුරතො පතිත්වා කාලං කරොති. මාතා පුත්තකං දිස්වා...... -එම- පිටුව 217

[13] ගුන්නං පිතුට්ඨානං කරොන්තීති ගො පිතරො, ගාවො පරිණයන්ති යථා රුචිං ගහෙත්වා ගච්ඡන්තීති ගොපරිණායකා, එවරූපෙ උසභෙ අතිරෙක පූජාය පූජෙති. පණීතං ගො භත්තං දෙති..... අයං පන තතො එක සක්කාරම්පි න කරොති. උසභා අතිරෙක පූජා අලභමානා ගොගණං න රක්ඛන්ති, පරිස්සයං න වාරෙන්ති - එම -



[14] ඒව මෙ ඛො භික්ඛවෙ එකාදසහි ධමෙමහි සමන්නාගතො භික්ඛු අභබ්බො ඉමස්මිං ධම්ම විනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිතු කතමෙහි එකාදසහි ඉධ භික්ඛවෙ භික්ඛු න රූපඤ්ඤූ හොති, න ලක්ඛණ කුසලො හොති.

මෙම අයහපත් ලක්ෂණ එකොළොසින් යුත් භික්ෂුව ශාසනික චර්යාවෙහි මනා ශික්ෂණය නොලබන්නෙකි. ඔහු ශාසනික වශයෙන් ලද යුතු අභිවෘද්ධිය ද නොලබයි.[15]

## යහපත් භික්ෂුවගේ ලක්ෂණ

පූර්වෝක්ත අයහපත් ලක්ෂණ බැහැර කරමින් යහපත් චර්යා වර්ධනය කරනු ලබන භික්ෂුව සසුනෙහි අභිවෘද්ධියට හෙවත් අනුයෝජනය ලබන භික්ෂුවක ලෙසින් බුදුරදුන්ගේ ඇගයීමට ලක්වේ. එවැනි භික්ෂූහු සසුන් පිළිවෙතෙහි මනා ලෙස නිතරතවෙමින් නිර්වාණගාමී ප්‍රතිපදාවෙහි සාඵල්‍යය ලබන්නට නිස්සෝ වෙති.

බුදු සසුනෙහි මනා ලෙස ශික්ෂණය ලබන භික්ෂුව සිය ප්‍රතිපදාවෙහි අවසාන ඵලය වන නිර්වාණය සාක්ෂාත් කරනු වස් මූලික වශයෙන් ලද යුතු දැනුමින් සමන්විත වීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව මිනිස් සංයුතියෙහි මූලිකම අංගය වන රූපය පිළිබඳ විශ්ලේෂණාත්මකව යථාර්ථවත් ලෙස දැනසිටීම වැදගත්ය. (රූපඤ්ඤු හොති) රූපය යනු පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන සතර මහා භූතයන්ගෙන් හෙවත්, ශක්තීන්ගේ සංයුතියක් බව හඳුනාගත යුතුය. මහා භූත සතර හා ඒවා ආශ්‍රිතව ඇතිවන උපාදාය රූප විසිහතරත් යන අටවිසි රූප පිළිබඳ දැනුම "රූපඤ්ඤු" යන්නෙන් අර්ථවත් වේ.[16] මෙම දැනුම විදර්ශනා භාවනාව වැඩීමට රුකුලක් වේ.

---

15 ඒව මෙ බො භික්ඛවෙ එකාදසහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අභබ්බො ඉමස්මිං ධම්ම විනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිතුං කතමෙහි එකාදසහි ඉධ භික්ඛවෙ භික්ඛු න රූපඤ්ඤු හොති, -එම- පිටුව 526

16 කථංච භික්ඛවෙ භික්ඛු රූපඤ්ඤු හොති. ඉධ භික්ඛවෙ භික්ඛු යං කිඤ්චි රූපං සබ්බං රූපං චත්තාරි මහා භූතානි, චතුන්නංච මහා භූතානං උපාදාය රූපන්ති යථා භූතං පජානාති, එවං බො භික්ඛවේ රූපඤ්ඤු හොති
ම.නි. I මහා ගොපාලක සූත්‍රය, පිටුව 532



"ලක්ඛණ කුසල" යනු බාලයා හෙවත් පණ්ඩිතයාගේ චරිත ස්වභාව හඳුනාගැනීමයි. එම ලක්ෂණ යථා පරිදි හඳුනා නොගැනීම සාවද්‍ය සංජානනයකි. බාලයාගේ ලක්ෂණ වෙන්කර හඳුනාගැනීමටත්, පණ්ඩිතයාගේ ලක්ෂණ හඳුනා ගැනීමටත් භික්ෂුව සමත්විය යුතුය. යමෙකු සිය සිත, කය, වචනය යන තිදොරින් සිදු කරන චර්යාවන් අයහපත් නම් එවැන්නා බාලයකු ලෙසත්, යහපත් චර්යා සහිත වූයේ නම් එවැන්නා පණ්ඩිතයකු ලෙසත් හඳුනාගැනීමෙහි සමත් භික්ෂුව "ලක්ඛණ කුසල" නම් වන තමා ආශ්‍රය කරන අය තෝරා බේරා ගෙන ආශ්‍රයට පෙළඹේ.

පුද්ගල සිත විවිධ වූ මනෝභාවයන්ට උල්පතකි. සිත තුළ පහළ වන කාම විතර්ක, ව්‍යාපාද විතර්ක, විහිංසා විතර්කා දී පාපී සිතිවිලි මෙන්ම වෙනත් පාප ධර්මයන් ද දුරු නොකරන භික්ෂුව, ගවයන්ගේ ඉහඳ ඉවත් නොකරන ගොපල්ලා හා සමාන වේ. එවැනි ගොපල්ලකුගේ ගවරැළ පිරිහීමට පත්වේ. ගොපල්ලා ද පස්ගෝරසයෙන් පිරිහීමට පත්වේ. එසේම භික්ෂුව ද තම සිත තුළ පහළ වන අයහපත් සිතුවිලි ඉවත් කිරීමට උත්සුක නොවන්නේ නම් ශාසනික චර්යාවෙහි තිසි ඵල නොලබයි. නිර්වාණගාමී ප්‍රතිපදාවෙහි අසමත් වූයේ වේ.[17]

භික්ෂුව සිය භික්ෂුත්වයෙහි මනා ලෙස ශික්ෂණය ලබන්නේ නම් මූලික වශයෙන් අවධානය යොමු කළ යුතු සාධකයක් වන්නේ සිය ඉන්ද්‍රියන් සංවර කර ගැනීම පිළිබඳවය. ඉන්ද්‍රියන් ආශ්‍රිතව බාහිර පරිසරය සමග සිදුවන අන්තර් ක්‍රියා තුළින් ලෝකය පිළිබඳ දැකීම හා අවබෝධය ලබා ගැනීම සිදුවේ. ඉන්ද්‍රියාශ්‍රිත ක්‍රියාකාරකම්වල නිරතුරුවම නිරතවීම මානව ක්‍රියාකාරිත්වයෙහි ස්වභාවයයි. ඉන්ද්‍රියන් හා බාහිර ලෝකය

---

17 න ආසාටිකං සාටෙන්ති හොතීති උප්පන්නානං කාම විතක්කාතීති එවං වුත්තේ කාම වුත්තේ කාම විත්තක්කාදයො න විනොදෙති, සො ඉමං අකුසල විතක්කං ආසාටිකං විතක්ක වසීනො හුත්වා විචරනෙතා කමට්ඨානං ගහෙත්වා වඩෙඪතුං න සක්කොන්ති, ම.නි.අ. පිටුව 218

02 MAY 2012

අතර පවත්නා සම්බන්ධතා පිළිබඳ පාලනිය ස්වභාවයකින් කටයුතු කිරීම ඉන්ද්‍රිය සංවරය ලෙස හැඳින්විය හැකිය. මෙම පාලනීය ස්වභාවය භික්ෂුව වෙතින් ඉවත්වයාම යනු භික්ෂුත්වයෙහි ලද යුතු ශික්ෂණය නොලැබීමකි. මෙම තත්වය ගොපල්ලා සිය ගව රැළෙහි ගවයන්ගේ වණයන්ට පිළියම් නොයෙදීම හා සමානය (න වණං පටිච්ඡාදෙතා හොති) ඉන්ද්‍රිය සංවරය කරගත් භික්ෂුව සිය සිත නිවන් මග කෙරෙහි යොමුකරලීමෙහි සමත්වේ. එසේම එම ප්‍රතිපදාවෙහි පරමාර්ථ සාධනයට සමත්වේ.[18]

භික්ෂුව පෝෂණය කරනු ලබන්නේ ගිහි සමාජය විසිනි. එකී ගිහි සමාජය වෙත ප්‍රති උපකාර කළ යුත්තේ ධර්මය දේශනා කිරීමෙනි.[19] නොඇසූ ධර්මය ඇසීමට අවස්ථාව සලසාලීමත් ඇසූ ධර්මය වඩාත් හොඳින් තහවුරු කරලීමත් භික්ෂුවගේ ධර්ම දේශනා කාර්යයෙහි අරමුණ විය යුතුය.[20] භික්ෂුව හා සමාජය අතර පැවතිය යුතු සම්බන්ධතාව අර්ථවත් වන්නේ සමාජයට දහම් දෙසීම මගින් මාර්ගෝපදේශකත්වය සැපයීමෙනි. දක්ෂ ගොපල්ලා ගවයින්ගේ නිරෝගී සුවය උදෙසා බෙහෙත් දුම් අල්ලන්නා සේ භික්ෂුව ද ධර්මය මනාව දැන, විස්තර සහිතව දේශනා කළ යුතුය. භික්ෂුව ගිහියන්ට ධර්ම දේශනා නොකරන විට, භික්ෂුව පිළිබඳ අයහපත් සිතුවිලි පහළ කර ගනිති. සිවුපසයෙන් උපස්ථාන නොකිරීමට ද පෙළඹෙති. එවිට භික්ෂුවට සිය භාවනාදිය පහසුවෙන් සිදුකරගැනීමට අවස්ථාව නොලැබේ. එසේම ධර්මය දේශනා

18 කායෙන සංවරො සාධු - සාධු වාචාය සංවරො
මනසා සංවරො සාධු - සාධු සබ්බත්ථ සංවරො
සබ්බත්ථ සංවුතො භික්ඛු - සබ්බ දුක්ඛා පමුඤ්චති

19 ගිහීනමුපකරොන්තානං - නිච්චමාමිස දානතො
කරොථ ධම්මදානෙන - තෙසං පච්චුපකාරං

20 දී.නි. 3, සිගාලක සූත්‍රය - පිටුව 288



කිරීම භික්ෂුව ගිහියා වෙනුවෙන් ඉටුකරනු ලබන උපකාරයකි. අනුග්‍රහයකි.[21] ධර්ම දේශනය මගින් පුද්ගලයා තුළ පවත්නා විවිධ වූ පාපාදි අඩු ලුහුඬුකම් දුරුවේ. ඔවුන් නිවන් මගෙහි අනුයුක්ත කරවීමට ද එය හේතුවේ.

ධර්මය පිළිබඳ කිසියම් ගැටලු සහගත ස්වභාවයක් මතු වූ විට බහුශ්‍රැත ධර්මධර විනයධර භික්ෂුවකගෙන් ඒ පිළිබඳ විමසා දතයුතුය.[22] එසේ නොකරන භික්ෂුව තොටුපල නොදන්නා ගොපල්ලා මෙන් සිය කාර්යයෙහි ලා දුර්වලතා ප්‍රකට කරයි. (න තිත්ථං ජානාති) තමා පිළිපදින ධර්මයෙහි මෙන්ම අනුනට දේශනා කරන ධර්මයෙහි මනා වූ අවබෝධය භික්ෂුවක සතුව පැවතිය යුතුය.

තම ගව රැළෙහි ගවයන් නිසි පරිදි ජලය පානය කළ බව, නොකළ බව අයහපත් ගොපල්ලා මනා සේ නොදනියි. (න පීතං ජානාති)[23] එලෙසම අයහපත් භික්ෂුව ද මනා ලෙස සකසා ධර්ම ශ්‍රවණය නොකරයි. ධර්ම දේශනා කරන තැනට ගොස් ධර්මය අසද්දීම නින්දට වැටේ. වෙනත් දෑ කථා කරයි. වෙනත් කල්පනාවෙන් පසුවේ. ගව රැළෙහි ගවයන් නිසි පරිදි ජලය පානය කළ බව දත් යහපත් ගොපල්ලා මෙන් යහපත් භික්ෂුව ද මනා ලෙස ධර්මය අසයි. ඒ පිළිබඳ අවදියෙන් යුතුව කටයුතු කරයි. එවැනි භික්ෂුව සිය පිළිවෙත් මගෙහි සපුරා අනුයෝජනය වේ.

21 ද්වෙ මෙ භික්ඛවේ අනුග්ගහා ධම්මා, කතමෙ ද්වෙ, ආමිසානුග්ගහොච ධම්මානුග්ගහොච ..... අ.නි. I, පිටුව 180

22 සො ගොපාලකො තිත්ථං න ජානාතති, එවං අයම්පි භික්ඛු ධමම තිත්ථං න ජානාති, අජානන්තො අවිසයෙ පඤ්හං පුච්ඡති ..... සො අත්තා සකංබො කම්මට්ඨානං ගහෙත්වා වඩ්ඪෙතුං සක්කොති, ම.නි.අ. II පිටුව 219

23 කථංච භික්ඛවෙ භික්ඛු පීතං ජානාති, ඉධ භික්ඛවෙ භික්ඛු තථාගතප්පවෙදිතෙ ධමම විනයෙ දෙසීයමානෙ ලබති ධම්ම වේදං ලභති ධම්මුපසංහිතං පාමුජ්ජං, ම.නි. I මහාගොපාලක සූත්‍රය, පිටුව 534.

නිර්වාණ මාර්ගයෙහි නියුක්ත භික්ෂුව ඒ සඳහා වූ පිළිවෙත වන ආර්ය අෂ්ටාංගික මාර්ගය මනාව වටහාගත යුතු වේ. සීල, සමාධි, පඤ්ඤා ආදී ත්‍රිශික්ෂා පූරණය මගින් නියෝජනය වන ලෝකෝත්තර මාර්ගය අවබෝධයකින් යුතුව පිළිපැදීම වැදගත්ය. එසේ නොකිරීම ගවපල්ලා සිය ගව රළ ගොදුරු සොයා ගමන් කරවිය යුතු මාර්ගය හෙවත් වීථිය (න වීථිං ජානාති)[24] නොදන්නාක් වැනිය.

භික්ෂුව සිය ආධ්‍යාත්මික සඵලතාව උදෙසා ධර්ම විනයෙහි හැසිරිය යුතු වේ. සතිපට්ඨානය හෙවත් සිත තුළ මනාව සිහිය පිහිටුවාගත යුතුවේ.[25] මහා සතිපට්ඨාන සූත්‍රය සිහිය පිහිටුවා ගතයුතු ආකාරය පිළිබඳව විශ්ලේෂණාත්මක විවරණයක් ඉදිරිපත් කරයි. පහත දැක්වෙන සාධක පිළිබඳව පූර්ණ දැනුම භික්ෂුව සතුවිය යුතුය.

1. කය පිළිබඳ විශ්ලේෂණය (කායානුපස්සනා)
2. වින්දනය පිළිබඳ විශ්ලේෂණය (වේදනානුපස්සනා)
3. සිත පිළිබඳ විශ්ලේෂණය (චිත්තානුපස්සනා)
4. ධර්මය පිළිබඳ විශ්ලේෂණය (ධම්මානුපස්සනා)

මෙම සතර සතිපට්ඨානය වැඩීම නිර්වාණ මාර්ගයෙහි සාඵල්‍යය උදෙසා වූ එකම මාර්ගය[26] බව වටහාගෙන එහි අනුයුක්තවීම භික්ෂුව "ගොචර කුසල" ලක්ෂණයෙන් සමන්විත වීමට හේතු වේ.

[24] ඉධ භික්ඛවෙ භික්ඛු අරියං අට්ඨංගිකං මග්ගං යථාභූතං පජානාති, එවං ඛො භික්ඛවෙ භික්ඛු වීථිං ජානාති - එම-

[25] ඉධ භික්ඛවෙ භික්ඛු චත්තාරො සතිපට්ඨානා යථා භූතං පජානාති, එවං ඛො භික්ඛවෙ භික්ඛු වීථිං ජානාති - එම-

[26] ඒකායනො අයං භික්ඛවෙ මග්ගො සත්තානං විසුද්ධියා සොක පරිද්දවානං සමතික්කමාය දුක්ඛ දොමනස්සාය අත්ථංගමාය ඤායස්ස අධිගමාය නිබ්බාණස්ස සච්ඡිකිරියාය යදිදං චත්තාරො සතිපට්ඨානා, දී.නි. 2, පිටුව - 436



භික්ෂුව සිය මූලික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා නිෂ්පාදන කාර්යයෙහි නොයෙදේ. ඔවුන් පෝෂණය කරනු ලබන්නේ සැදැහැවත් ගිහියන් විසිනි. එනිසා පමණ දැන සිවුපසය පිළිගැනීම හා පරිභෝජනය කිරීම භික්ෂුව සතු වගකීමකි. පමණ නොදන්නා භික්ෂුව කෙරෙහි සැදැහැතියෝ කළකිරෙති. නැවත සිවුපසය නොදෙති. එනිසාම සිය මූලික අවශ්‍යතා සපුරා ගැනීමෙහි අසමත් වන භික්ෂුව සිය පිළිවෙත් පිරීමෙහි ද අසමත් වේ.[27] ඔහු කමටහන් නොවඩයි. ගොපල්ලා ගවරැළෙහි වසු පැටවුන්ට ඉතිරි නොකොට කිරි දෙවීම නිසා (අනවසෙසදොහී) සිය ගව රළ විනාශයට පමුණුවන්නාක් මෙන් භික්ෂුව සිය අධ්‍යාත්මික පරමාර්ථය ද විනාශ කර ගනියි.

විවිධ සූත්‍ර දේශනාවන්හි සිවුපස පරිභෝජනයෙහි දී භික්ෂුව පිළිපැදිය යුතු පිළිවෙත විවරණය කෙරේ. පැණි සොයා යන මී මැස්සා මලෙහි පැහැයට ද, සුවඳට ද හානි නොකර පැණි උරා බොන්නාක් මෙන් සිය දායකයන් පීඩාවට පත්වන ආකාරයෙන් ප්‍රත්‍ය පරිහරණයේ භික්ෂුව යෙදිය යුතුය.[28]

යහපත් ගවපල්ලා සිය ගවරැළෙහි නායක ගවයන් හඳුනාගනියි. ඔවුනට විශේෂ සැලකිලි දක්වයි. එසේම භික්ෂුව වැඩිහිටි මහ තෙරුන් වහන්සේලාට මෛත්‍රී කාය කර්මාදියෙන් අතිරේක පූජා පවත්වයි. එනිසාම ඒ මහාතෙරවරු එම භික්ෂුව පිළිබඳ අනුකම්පා, සහගතව පිළිපදිති. අවවාද දෙති. ආමිසාදියෙන් සංග්‍රහ කරති.[29] එලෙස මහ

[27] පමාණ යුක්තං අගහෙත්වා යං ආහාරන්ති තං සබ්බං ගණ්හාතීති අත්ථො, මනුස්සා විප්පටිසාරිනො න පුන අභිහරිත්වා පවාරෙන්ති, සො පච්චයෙහි කිලමන්තො කම්මට්ඨානං ගහෙත්වා වඩ්ඪේතුං න සකෙකාති. ම.නි. අ. III, පිටුව 220

[28] යථාපි භමරො පුප්ඵං - වණ්ණ ගන්ධං අහෙඨයං
එලෙති රසමාදාය - එවං ගාමෙ මුනී චරෙ
ධම්මපදය

[29] ඉධ භික්ඛවේ භික්ඛු යෙ තෙ භික්ඛු ථෙරා රත්තඤ්ඤූ චිරපබ්බජිතා සංඝපිතරො සංඝ පරිණායකා තෙසු මෙත්තං කායකම්මං පච්චුපට්ඨාපෙති ම.නි. I මහා ගොපාලක සූත්‍රය, පිටුව 534

තෙරුන්ගේ අවවාදාදියෙන් ශික්ෂණය ලබන භික්ෂුව සිය නිර්වාණාධිගමය ලබයි.

**සමාලෝචනය :-**

නිවන් මගෙහි නියුක්ත වන භික්ෂුවක සිය කාර්ය සඵලාය උදෙසා ක්‍රියා කළ යුතු ආකාරය මූලික වශයෙන් මෙම සූත්‍රයෙහි විරණය වේ. එසේම භික්ෂුව සමාජගත සාමාජිකයෙකු වශයෙන් ඉටුකළ යුතු වගකීම් සමහරක් ද මෙහි දැක්වේ. ශික්ෂාකාමිත්වය, අල්පේච්ඡතාව, සුභරතාව, ධර්මධර බව ආදී බොහෝ ගුණාංග භික්ෂු ජීවිතයෙහි සාර්ථකත්වය උදෙසා අත්‍යවශ්‍ය බව මෙහිලා අවධාරණය කෙරේ. යහපත් භික්ෂු ජීවිතයක් සඳහා ලද හැකි පිටිවහල ඉමහත් බව මේ තුළින් ප්‍රකට වේ.